# අම්පාර මහජන පුස්තකාලය.

01.අම්පාර මහජන පුස්තකාලය විමර්ශන අංශය, බැහැරදීමේ අංශය, ළමා අංශය, සඟරා යන අංශයන් සතියේ දින හතම පෙ.ව.8.30 සිට ප.ව.4.30 දක්වා විවෘතව පවතී. පුවත්පත් අංශය පෙ.ව.8.30 සිට ප.ව.7.00 දක්වා විවෘතය.රජයේ නිවාඩු දින සහ පොහොය දිනය පුස්තකාලය වසා ඇත.

02. අම්පාර නගරයේ ස්ථිර පදිංචි කරුවන්හට පමණක් පුස්තකාලයේ නිත්‍ය සාමාජිකත්වය ලබා දෙනු ඇත. පාසල් සිසුන් සඳහා 13 වසර දක්වා සාමාජිකත්වය ලබා දෙනු ලැබේ.

සාමාජික අයදුම්පත රු.20/-කි.

වැඩිහිටි සාමාජිකයන් සඳහා ඇපතැන්පතුව රු.200/-කි.

පාසැල් සිසුන් සඳහා රු.50/-කි.

වාර්ෂිකව මෙම සාමාජිකත්වය අළුත් කල යුතුය.

වැඩිහිටි සාමාජිකයන් සඳහා ඇපකරුවන් ලෙස අම්පාර නගරයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු,සාමාදාන විනිශ්චයකාරවරයෙකු,අම්පාර නගරයේ පූජකතුමෙකු,අම්පාර නගරයේ ස්ථිර පදිංචිය ඇති වෛද්‍යවරයෙකු හෝ නීතඥයෙකු,ග්‍රාම නිළධාරීවරයෙකු සහතික කල හැක.

පාසල් සිසුන් සඳහා පාසලේ විදුහල්පතිතුමා ගේ නිර්දේශය ලබා ගත යුතුය.

03.පාඨකයින්ගේ වගකීම

- පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයතුලදී පාඨකයා ඉවසීමෙන් සහ මනා විනයකින් කටයුතු කල යුතුය.
- පාඨකයන් පුස්තකාලයේ නීති රීති වලට එකග විය යුතුය.
- පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය තුළදී නිශ්ශබ්දතාවය රැක ගැනීමට උදවු වීම.
- අදාළ තොරතුරු මධ්‍යස්ථානයේ ඇති දේපළ වලට හානි පැමිණවීමෙන් වැළකීම.
- සාමාජිකත්වය ලැබිම,අළුත් කිරීම, දඩ මුදල් ගෙවීම සහ වෙනත් අය කිරීම් වලදී ද පාඨක සහය ආයතනයේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය වේ.
- පුස්තකාලාධිපති හෝ අදාළ කාර්ය මණ්ඩලයේ අවසරයකින් තොරව පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයේ ඇති තාක්ෂණික මෙවලම් පරිහරණය නොකිරීම.
- පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සමඟ ඉතා සුහදව කටයුතු කිරීම.
- ප්‍රදේශයේ සහ ආයතනයේ පවතින තොරතුරු නිධිය පුස්තකාලය බව තේරුම් ගැනිම.

- පුස්තකාලය විසින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් වලදී පාඨකයන්ටද යම් දායකත්වයක් ලබා දිමට හැකි බව අවබෝධ කර ගැනීම සඳහා තොරතුරු සම්පත් අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කර ගැනීම සඳහා උදවු වීම.